CEYLINCO GENERAL INSURANCE LIMITED

# සෙලින්කෝ "සපෝට් ලයින්" රක්‍ෂණ ඔප්පුව

මෙහි ඇතුළත් උපලේඛණයේ නම සඳහන් (මෙහි මින් මතු රක්‍ෂිතයා යනුවෙන් හඳුන්වනු ලබන) අය (මෙහි මින් මතු සමාගම යනුවෙන් හඳුන්වනු ලබන) **සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** සමග රක්‍ෂණයක් සලසා ගැනීමේ අභිලාෂයෙන් රක්‍ෂණයේ ප්‍රතිෂ්ඨාව වශයෙන් වාරිකය ගෙවා සහ/හෝ ගෙවීමට එකඟ වී මේ සම්බන්ධයෙන් ලිඛිතව සමාගම වෙත භාරදීමට කටයුතු සලසා ඇති යෝජනාවේ හෝ ප්‍රකාශයේ අන්තර්ගත ප්‍රකාශවල සත්‍යතාවය සහතික කරමින් රක්‍ෂිතයා විසින් අත්සන් තබන ලදුව, සමාගම සහ රක්‍ෂිතයා අතර ගිවිසුම සඳහා පදනම් විය යුත්තේ එකී යෝජනාව හෝ ප්‍රකාශය බවට එකඟ වී ඇති හෙයින් ද,

දැන් මෙම රක්‍ෂණ ඔප්පුව සාක්‍ෂි දරණ වගනම් උපලේඛණයේ සඳහන් රක්‍ෂණ කාලපරිච්ඡේදය තුළ මෙහි අන්තර්ගත හෝ සඳහන් කර හෝ අන්‍යාකාරයෙන් ප්‍රකාශිත නියමයන්ට ව්‍යාතිරේකයන්ට සහ කොන්දේසිවලට යටත්ව මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති ප්‍රමාණයන්ට හා ආකාරයට සමාගම විසින් රක්‍ෂිතයාට, වන්දි ගෙවීම් හෝ රක්‍ෂිතයා මිය ගිය විටකදී උපලේඛණයේ නිශ්චිතව සඳහන් වන යැපෙන්නන්ට මුදල් ගෙවීම කරනු ලැබේ.

මෙයට සාක්‍ෂි වශයෙන් වර්ෂ ........................................ වන මෙදින ........................................ දී
**සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** වෙනුවෙන් මෙම රක්‍ෂණ ඔප්පුව අත්සන් කරන ලදී.

..........................................................................................

**සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්**
බලයලත් නිලධාරියාගේ අත්සන

# ප්‍රතිලාභ උපලේඛණය

| | සැලසුම් 1 | සැලසුම් 2 | සැලසුම් 3 |
|---|---|---|---|
| "ඒ" කොටස<br>පුද්ගල හදිසි අනතුරු ආවරණය | රු.<br>200,000/- | රු.<br>300,000/- | රු.<br>400,000/- |
| "බී" කොටස<br>ජීවිත රක්‍ෂණාවරණය<br>ස්වභාවික මරණයකදී | 50,000/- | 75,000/- | 100,000/- |
| "සී" කොටස<br>අවමංගල්‍යාධාර<br>රක්‍ෂිතයා වියෝවීමකදී<br>පවුලේ සාමාජිකයෙකුගේ වියෝවීමකදී | <br><br>10,000/-<br>5,000/- | <br><br>15,000/-<br>7,500/- | <br><br>20,000/-<br>10,000/- |
| "ඩී" කොටස<br>දරුවන් සඳහා අධ්‍යාපනික දීමනාව<br>මාසික දීමනාව එක් දරුවෙකුට<br>(දරුවන් දෙදෙනෙකුට අවුරුදු 18<br>දක්වා ගෙවනු ලැබේ) | 500/- | 750/- | 1,000/- |
| "ඊ" කොටස<br>ආදායම අහිමිවීම<br>රක්‍ෂිතයා රෝහල්ගතවීමකදී (දිනකට)<br>ස්වභාවික විපතක් නිසා (දිනකට)<br>එක් සිදුවීමක දී උපරිමය දින 3<br>වසරකට උපරිමය දින 10 | <br><br>500/-<br>1,000/- | <br><br>750/-<br>1,500/- | <br><br>1,000/-<br>2,000/- |

**ඒ කොටස**

## පෞද්ගලික හදිසි අනතුරු ප්‍රතිලාභ

උපලේඛණයේ දක්වා ඇති රක්‍ෂණ කාල පරිච්ඡේදය තුළ රක්‍ෂිතයාට උදක්ම ප්‍රචණ්ඩ හදිසි අනතුරුබාහිර හා දෘශ්‍යමාන උපක්‍රමයකින් ඕනෑම කායික තුවාලයක් සිදුවුවහොත් ද එම තුවාලය තනිකරම, වෙනත් කිසිදු හේතුවකින් තොරව පහත සඳහන් ප්‍රතිඵල අතුරින් ඕනෑම ප්‍රතිඵලයක් ඇති වීමට එකම හේතුව වී ඇත්නම් ද ඔප්පුවේ දක්වා ඇති නියමයන් කොන්දේසි සහ ව්‍යාතිරේක ප්‍රකාර ප්‍රතිලාභ උපලේඛණයේ දක්වා ඇති යැපෙන්නන්ට පහත විස්තර කර ඇති ප්‍රතිලාභ සමාගම විසින් ගෙවනු ලැබේ.

| **ප්‍රතිඵල** | | **ප්‍රතිලාභ** |
|---|---|---|
| 1) මරණය | | ප්‍රතිලාභ උපලේඛණයේ සඳහන් කර ඇති රක්‍ෂිත මුදලෙන් 100% ක් |
| 2) ඇස් දෙකේම සම්පූර්ණ පෙනුම මුළුමනින්ම සහ සුව කළ නොහැකි අයුරින් නැතිවීම හෝ අත් පා දෙකක් හෝ වැඩි ගණනක් නැතිවීම හෝ අත් පා වලින් එකක් නැතිවීම සහ එක් ඇසක සම්පූර්ණ පෙනුම මුළුමනින්ම සහ සුව කළ නොහැකි අයුරින් නැතිවීම | සිද්ධිය සිදුවී මාස තුනක් ඇතුළත සිදු වූ විට | ප්‍රතිලාභ උපලේඛණයේ සඳහන් කර ඇති රක්‍ෂිත මුදලින් 75% ක් |
| 3) එක ඇසක සම්පූර්ණ පෙනුම මුළුමනින්ම සහ සුව කළ නොහැකි අයුරින් නැතිවීම හෝ එක් අතක් හෝ පයක් පිළිවෙළින් මැණික් කටුවෙන් හෝ ඇස්වටහෙන් නැතහොත් ඊට ඉහළින් ශරීරයෙන් වෙන්වීමෙන් මුළුමනින්ම නැතිවීම හෝ සම්පූර්ණ අතක ප්‍රයෝජනය ස්ථිර වශයෙන් මුළුමනින්ම නැතිවීම | - එම - | ප්‍රතිලාභ උපලේඛණයේ සඳහන් කර ඇති රක්‍ෂිත මුදලින් 50% ක් |
| 4) කවරාකාරයක හෝ ඕනෑම සේවා නියුක්තියක හෝ රැකියාවක යෙදීමෙන් හෝ එවැන්නකට අවධානය යොමු කිරීමෙන් වැළකෙන පරිදි (ඉහත 2 සහ 3 ඡේදවල සඳහන් අන්දමට නොව වෙනත් අන්දමකට) ස්ථිර වශයෙන් මුළුමනින්ම ඇතිවන අශක්නුතාව | සිද්ධිය සිදුවී මාස12ක් තුළදී සිදු වූ විට | ප්‍රතිලාභ උපලේඛණයේ සඳහන් කර ඇති රක්‍ෂිත මුදලින් 75% ක් |

**බී කොටස**

**ස්වභාවික මරණ ආවරණය**

උපලේඛණයේ දක්වා ඇති රක්‍ෂණ කාලය තුළදී ඉහත (අ) කොටසේ දක්වා ඇති පරිදි හදිසි අනතුරක් හැර වෙනත් හේතුවක් නිසා රක්‍ෂිතයාගේ මරණය සිදුවුවහොත් මරණය සිදුවන අවස්ථාවේ රක්‍ෂිතයාගේ වයස අවුරුදු 60ට අඩු වන කල්හි ප්‍රතිලාභ උපලේඛණයේ සඳහන් රක්‍ෂිත මුදල මෙහි සඳහන් නියමයන්ට, කොන්දේසි වලට සහ ව්‍යතිරේකවලට යටත්ව සමාගම විසින් ගෙවනු ලැබේ.

**සී කොටස**

**අවමංගලය වියදම්**

උපලේඛණයේ සඳහන් වන රක්‍ෂිතයාගේ මරණය හෝ රක්‍ෂිතයාගේ කාලත්‍රයාගේ මරණය හෝ ළමයින්ගේ මරණය සිදු වූ විට රක්‍ෂිතයාට හෝ රක්‍ෂිතයාගේ මරණය සිදු වූ විටක නම් කාලත්‍රයාට සහ/හෝ ළමයින්ට ප්‍රතිලාභ උපලේඛණයෙහි සඳහන් වන ප්‍රමාණය දක්වා වූ වියදම් මෙම රක්‍ෂණ ඔප්පුවට අදාල නියමයන්ට කොන්දේසිවලට සහ ව්‍යතිරේකවලට අනුකූලව ප්‍රතිපූරණය කරනු ලැබේ.

**ඩී කොටස**

**අධ්‍යාපන දීමනා**

රක්‍ෂිතයාගේ මරණය සිදු වූ විට, ඔහුගේ දරුවන් රජයේ පාසලක හෝ ලියාපදිංචි කර ඇති පෞද්ගලික පාසලක හෝ රජයේ කාර්මික විද්‍යාලයක අධ්‍යාපනය හදාරන්නේ නම් උපලේඛණයේ සඳහන් වන මාසික අධ්‍යාපන දීමනාවක් එම දරුවන්ට ගෙවනු ඇත. එසේකුදු වුවත්, මෙම ප්‍රතිලාභය ලැබීමට හිමිකම ඇත්තේ වයස අවුරුදු 18ට අඩු දරුවන් දෙදෙනෙකුට පමණි.

**ඉ කොටස**

**ආදායම නැතිවීම**

රක්‍ෂිතයා රෝහල්ගතව සිටින විට හෝ රක්‍ෂණ ඔප්පුවේ විස්තර කර ඇති ආකාරයට ස්වාභාවික ව්‍යසනයක් හේතු කොට ගෙන රක්‍ෂිතයාගේ ව්‍යාපාර පරිශ්‍රය හානියට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස රක්‍ෂිතයාගේ ව්‍යාපාරය වසා ඇති විට උපලේඛණයේ දක්වා ඇති ආකාරයේ දෛනික දීමනාව සමාගම විසින් රක්‍ෂිතයාට අනෙකුත් නියමයන්ට කොන්දේසිවලට සහ ව්‍යතිරේකවලට යටත්ව ගෙවනු ලැබේ.

**සාමාන්‍ය බැහැර කිරීම්**

පහත දැක්වෙන කවර හෝ හේතුවක් නිසා මරණය/තුවාල සිදුවන අවස්ථාවකදී සමාගම ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටී.

1. හදිසි අනතුරක් හේතුවෙන් මරණය/තුවාල සිදුවන්නේ නම්, මිස මෙම රක්‍ෂණය අරඹන දිනයේ සිට පළමු දින 30ක කාලසීමාව තුළ සිදුවන අසනීපයක්
2. තමා විසින් හිතාමතාම තුවාල සිදුකර ගැනීම, දිවි නසා ගැනීමට තැත් කිරීම, උමතුව, දුරාචාරය, කවර හෝ සාපරාධී ක්‍රියාවකට සහභාගි වීම හෝ යම් මත්පැන් වර්ගයක් පානය කර බීමත්ව සිටීම. මත්ද්‍රව්‍ය හෝ විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම
3. යුධ හමුදාවේ නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ පොලීසියේ හෝ ඒ සමාන රෙජිමේන්තු බලකායක හෝ සංවිධානයක රාජකාරියේ යෙදී සිටිය දී තුවාල වීම
4. යුද්ධය ආක්‍රමණය විදේශ සතුරු ක්‍රියාවන් එදිරිවාදිකම් යුද්ධයක් වැනි මෙහෙයුමක් (යුධ ප්‍රකාශකර හෝ නොමැති වුවද) සහ සිවිල් යුද්ධයක්
5. මහජන කැරැල්ලක්, හමුදා කැරැල්ලක්, කැරලි කෝලහලයක්. කැරැල්ලක් යුධමය වශයෙන් හෝ බලහත්කාරයෙන් බලය අල්ලා ගැනීම වැනි හෝ ඒ සමාන මහජන කැළඹීමක් හෝ කැරැල්ලක්
6. කැරලි කෝලහලයක්, මහජන කැරැල්ලක්, හමුදා කැරැල්ලක්, වැඩ වර්ජනයක හෝ කිසියම් ක්‍රියාවක් (යම් සංවිධානයක් හෝ සාමූහික පිරිසක් වෙනුවෙන් වුවද) හෝ ත්‍රස්තවාදය හෝ ප්‍රචණ්ඩ ක්‍රියා මගින් නීති ප්‍රකාර හෝ තත්ත්වාකාරයෙන් බලයට පත් වූ මෙය බලහත්කාරයෙන් පෙරලා දැමීම සඳහා යම් සංවිධානයක් වෙනුවෙන් ඍජුව සහභාගිවීමේ දී
7. ත්‍රස්තවාදය හෝ ප්‍රචණ්ඩ ක්‍රියා මගින් නීති ප්‍රකාර හෝ තත්ත්වාකාරයෙන් පත්වන රජය බලහත්කාරයෙන් පෙරලා දැමීම සඳහා කටයුතු කරනු ලබන යම් සංවිධානයක් සම්බන්ධයෙන් හෝ ඒ වෙනුවෙන් කටයුතු කරන යම් තැනැත්තෙකු විසින් කරනු ලබන කවර හෝ ක්‍රියාවක් එසේකුදු වුවත් මෙම නිෂේධය "ඒ" කොටස සම්බන්ධයෙන් අදාළ නොවේ.

# උපලේඛණය

රක්‍ෂණ ඔප්පු අංකය: ..............................................................................................................

රක්‍ෂිතයාගේ නම: ..............................................................................................................

ලිපිනය: ..............................................................................................................

..............................................................................................................

ව්‍යාපාරයේ ස්වභාවය: ..............................................................................................................

ව්‍යාපාරයේ ලිපිනය: ..............................................................................................................

රක්‍ෂණ කාලය: .............................. දින ප.ව. 4.00 සිට .............................. දින ප.ව. 4.00 දක්වා

වාර්ෂික වාරිකය : ..............................................................................................................

රක්‍ෂණ සැලැස්ම: ..............................................................................................................

පැවරුම්ලාභීන් ලෙස ඇතුළත් කළයුතු පවුලේ සාමාජිකයන්

(නම්)

1. කාලත්‍රයා ..............................................................................................................

2. දරුවා 1 .............................................................................................. (දුව/පුතා)

දරුවා 2 .............................................................................................. (දුව/පුතා)

මෙයට සාක්ෂි වශයෙන් වර්ෂ .............................. දී .............................. මස

.............................. දින .............................. දී අත්සන් තබන ලදී.

..............................................................................................................

**සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්**

**බලයලත් නිලධාරියාගේ අත්සන**

"ඒ" කොටස යටතේ පිරිනමන මෙම ආවරණය රජයේ වැඩ වර්ජන, කැරලි කෝලාහල, මහජන කැලඹීම් සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා පිහිටුවා ඇති අරමුදල වෙනුවෙන් (Government Fund for strike, Riots civil commotion and terrorism) පිරිනමා ඇති නිසා ඒ සම්බන්ධයෙන් වන වගකීම එම අරමුදල මත පැවරෙනු ඇත. කෙසේ වුවද එම අරමුදලේ වගකීම එක පුද්ගලයෙකු වෙනුවෙන් උපරිමය රුපියල් 2,000,000/-ක් වන අතර, මෙම සමාගම විසින් හෝ වෙනයම් රක්ෂණ සමාගමක් මගින් නිකුත් කරනු ලබන සියලුම රක්ෂණ ඔප්පු යටතේ වන වගකීම මෙම උපරිමයට යටත් වනු ඇත.

8. දෙපා වලින් හැර වෙනත් ආකාරයෙන් දිවීමේ තරඟ හෝ යම් භයානක හෝ අනතුරුදායක ක්‍රීඩා හෝ තරඟ, දඩයමේ යාම, විනෝදය පිණිස කඳු නැගීම, දෙපා වලින් හැර වෙනත් කවර හෝ වර්ගයේ තරඟ දිවීම සඳහා සහභාගී වීමේදී හෝ එවැන්නක් වෙනුවෙන් පුහුණුවීමේදී කවර හෝ ආකාරයෙන් කිමිදීම හෝ දිය යට කිසියම් කාර්යයක් හෝ පොළොව යට කවර හෝ කටයුත්තක නිරත වීම

9. ඒඩ්ස් රෝගය සහ මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය (එච්.අයි.වී) මගින් වැළඳෙන රෝග සහ ලිංගික ක්‍රියා හේතුකොට ගෙන බෝවෙන රෝග (සමාජ රෝග)

10. නීති විරෝධී ක්‍රියාවන් සිදු කිරීම

11. න්‍යෂ්ටික ප්‍රතික්‍රියාව විකිරණ සහ න්‍යෂ්ටික හෝ රසායනික දූෂණය

12. පූර්වයෙන් පැවති තත්ත්වයන් (අර්ථ නිරූපනයේ පහදා ඇති අයුරු)

13. නිදන්ගත රෝග (අර්ථ නිරූපනයේ පහදා ඇති අයුරු)

## අර්ථ නිරූපනය

**කායික තුවාලය**

"කායික තුවාලය" යනුවෙන් ශ්‍රී ලංකාවේ ඕනෑම තැනකදී තනිකරම සහ සෘජුවම හදිසි අනතුරු මාර්ගයෙන් රක්ෂිතයාට හටගන්නා තුවාලයක් අදහස් වන අතර අසනීප වීමෙන්, රෝගයකින් හෝ වෛද්‍ය විධිභින්නතාවකින් සිදුවන කායික තුවාල මීට ඇතුළත් නොවේ.

**රෝහල**

රෝගීන් සහ තුවාලකරුවන් රැක බලා ගැනීමටත් ඔවුන්ට ප්‍රතිකාර කිරීමටත් රෝහලක් වශයෙන් විධි වූ පරිදි පිහිටුවා ලියාපදිංචි වී ඇති ආයතනයකි. එය පහත සඳහන් කරුණු වලින් සමන්විතව තිබිය යුතුය.

අ. රෝග විනිශ්චය කිරීම ප්‍රතිකාර කිරීම සහ ප්‍රධාන ශල්‍යකර්ම සඳහා සංවිධිත පහසුකම් තිබිය යුතුය.

ආ. ලියාපදිංචි වූ හෙද හෙදියන් ගේ සේවය දවසේ පැය 24 තුළම ලබාදිය යුතුය.

ඇ. කායික වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ පැවතිය යුතුය.

ඈ. එය මූලික වශයෙන් සායනයක් හෝ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් හෝ ඒවාට ඇබ්බැහි වූවන් රැක බලා ගන්නා ස්ථානයක් හෝ සාත්තු සේවා ස්ථානයක් හෝ විවේක ස්ථානයක් හෝ රෝගීන් සඳහා වූ විවේකාගාරයක් හෝ වැඩිහිටි නිවාසයක් හෝ ඒ සමාන ආයතනයක් නොවිය යුතුය.

ඉ. ලියාපදිංචි ආයුර්වේද රෝහලක් විය යුතුය (දේශීය හෝමියෝපති ප්‍රතිකාරයේ කටු චිකිත්සාව තොරවූ)

**ස්වාභාවික ව්‍යසන**

මෙයින් අදහස් වන්නේ භූමිකම්පා, ගිනි කඳු පිපිරීම් හෝ වෙනත් ස්වාභාවික විපර්යාස, චණ්ඩ මාරුත, දැඩි සුළං, අධිවේගී මාරුත, සුළි සුළං, කුණාටු සහ තද සුළං හෝ වෙනත් දේශගුණික විපර්යාසයන්ය.

**නිදන්ගත රෝග**

මෙයින් අදහස් වනුයේ උපදින අවස්ථාවේ දැනගන්නට තිබෙන වෛද්‍ය අසාමාන්‍යතා මෙන්ම උපතේ සිට මාස හයක් තුළ දී හටගන්නා නව ප්‍රසූති කායික අසාමාන්‍යතා වේ. සියලුම ආකාරයේ හර්නියා රෝගය, රක්ෂිතයා මෙම ඔප්පුව යටතේ අඛණ්ඩ ආවරණය ලද දිනයෙන් පසු හටගත් හදිසි අනතුරකින් හටගත් තුවාලයකින් ඇති වන අපස්මාරය හැර වෙනත් අපස්මාර යන මෙවා ඒට ඇතුළත් වේ.

**පූර්වයෙන් පැවති තත්ත්වයන්**

මෙයින් අදහස් වන්නේ මෙම ඔප්පුව යටතේ රක්‍ෂිතයා අඛණ්ඩව ආවරණයවීමට පටන් ගත් දිනට පෙර පැවති අශක්නුතා රෝග සහ රක්‍ෂිතයා සඳහා

අ. මෙම ඔප්පුව ආරම්භ වීමට පෙර අවුරුදු තුනක කාලයක් තුළ ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර සහ

ආ. මෙම ඔප්පුව ආරම්භ කිරීමේ දින හෝ එම දිනට කලින් පැවති තත්ත්වය පිළිබඳ රෝග ලක්‍ෂණ දැන සිටීම හෝ දත යුතුව සිටීමත්ය.

**යැපෙන්නෝ**

මෙයින් අදහස් වන්නේ කාලත්‍රයා (එනම් යෝජනාකරුගේ නීත්‍යානුකූල භාර්යාව හෝ ස්වාමිපුරුෂයා) සහ ඔවුන්ගේ වයස අවුරුදු 18ට අඩු යැපෙන දරුවන්ය. (යැපෙන දරුවන් යනුවෙන් අදහස් වනනේ මෙම ඔප්පුව යටතේ ප්‍රතිලාභ ලබන අවස්ථාවේ සාමාජිකයාගේ ඉපැයීම් මත යැපෙන නීත්‍යානුකූල වූ ද, අවිවාහක වූ ද, රැකියාවක් නොකරන්නා වූ ද පුතුන් සහ දියණියන් ය.)

**අශකත්‍රතාව**

මෙයින් අදහස් වන්නේ තනි හදිසි අනතුරකින් හෝ අඛණ්ඩව සිදු වූ හදිසි අනතුරු මාලාවකින් හටගත් අසනීපයක්, රෝගයක් සහ/හෝ තුවාලය

**රක්‍ෂිතයා රෝහල්ගත කිරීම**

උපලේඛණයේ නම සඳහන් වන රක්‍ෂිතයා රජයේ රෝහලක හෝ පිළිගත් සාත්තු නිවාසයක හෝ (දේශීය හෝමියෝපති ප්‍රතිකාර හෝ කටු චිකිත්සාව හැර) ලියාපදිංචි වූ ආයුර්වේද රෝහලක අදාළ නියමයන් සහ කොන්දේසි ප්‍රකාර අවම වශයෙන් පැය 24ක කාලයක් රෝහල් ගත කර ඇති විමය. හදිසි අනතුරක දී හෝ ශල්‍යකර්මයක් සහිත අවස්ථාවක දී පැය 24ක අවම කාලය අදාළ නොවේ.

## කොන්දේසි

මෙම රක්‍ෂණ ඔප්පුව සහ උපලේඛණය එකම ගිවිසුමක් වශයෙන් එකතුව කියවිය යුතු අතර යම් පදයක් හෝ පාඨයක් සම්බන්ධයෙන් මෙම රක්‍ෂණ ඔප්පුවේ හෝ උපලේඛණයේ කවර හෝ කොටසක නිශ්චිතව දක්වා ඇති අර්ථය එම පදයේ හෝ පාඨයේ සඳහන් වන කවර හෝ අවස්ථාවක එම පදයේ හෝ පාඨයේ සඳහන් එකී නිශ්චිත අර්ථයම ඇති වන්නේය.

**1. දැනුම් දීම**

සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන සෑම දැනුම්දීමක් හෝ නිවේදනයක් ලිඛිතව එවිය යුතුය. මෙම රක්‍ෂණ ඔප්පුවේ කොන්දේසි වෙනස් කිරීම හෝ එහි කවර හෝ සටහනක් යෙදීම සමාගමේ බලයලත් නියෝජිතයකු විසින් අත්සන් කර හෝ කෙටිසන් කර ඇත්නම් එකී වෙනස් කිරීමේ සටහන් යෙදීම කිසිසේත් වලංගු ලෙස සලකනු නොලැබේ.

**2. වගකීම සම්බන්ධයෙන් පූර්ව කොන්දේසි**

රක්‍ෂිතයා විසින් මෙම රක්‍ෂණ ඔප්පුවේ නියමයන් විධිවිධාන සහ කොන්දේසි ක්‍රියාත්මක කර නිසි ලෙස පිළිපැදිය යුතු අතර රක්‍ෂිතයා විසින් පිළිපැදිය යුතු හෝ ඉටු කළ යුතු ඕනෑම දෙයක් සම්බන්ධයෙන් එකී නියමයන්, විධිවිධාන සහ කොන්දේසි පවතින තාක් කල් සමාගම යම් වගකීමකට බැඳීමට පෙර කොන්දේසි වශයෙන් ක්‍රියාත්මක කළ යුත්තේය.

**3. සාවද්‍ය ලෙස තොරතුරු සැපයීම/වංචාව**

රක්‍ෂිතයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව හෝ ප්‍රකාශය කවර හෝ ලෙසකින් අසත්‍ය වුවහොත් හෝ අනතුරක් සම්බන්ධයෙන් බලපාන යම් වැදගත් කරුණක් සාවද්‍ය ලෙස මෙහි සඳහන් කළහොත් හෝ එහි සඳහන් කිරීම පැහැර හැරියහොත් හෝ අසත්‍ය ප්‍රකාශයක්, සාවද්‍ය තොරතුරු සැපයීමක් හෝ කරුණු වසන් කිරීමක් හෝ මගින් මෙම රක්‍ෂණය ලබාගතහොත් රක්‍ෂණය කිසිදු ලෙසකින් අලුත් කරගතහොත් හෝ කිසියම් හිමිකම් පෑමක් කරනු ලැබුවහොත් හෝ එය වංචා සහගත හෝ අතිශයෝක්තියෙන් කරුණු දැන්වීමක් හෝ වන්නේය. එසේ නැතහොත් මෙම කවර හෝ අවස්ථාවකදී එම කරුණු සනාථ කිරීම සඳහා යම් ව්‍යාජ ප්‍රකාශයක් හෝ අසත්‍ය කරුණු ඉදිරිපත් කළහොත් හෝ මෙම රක්‍ෂණ ඔප්පුවේ බල රහිත වන්නේය.

## 4. අවදානම වෙනස්වීම

රක්ෂිතයා විසින් ස්වකීය රැකියාව, ව්‍යාපාරය, කාර්යයන් හෝ වැඩකටයුතු සම්බන්ධයෙන් සිදුවන යම් වෙනස්කම් පිළිබඳව සමාගම වෙත වහාම ලිඛිතව දැනුම් දිය යුතු අතර සමාගම විසින් නියම කරනු ලැබිය හැකි යම් අමතර වාරිකයක් ගෙවිය යුතුය.

රක්ෂිතයා විසින් රක්ෂණ ඔප්පුව එක් එක් අවස්ථාවේදී අලුත් කිරීමට පෙර තමාට දැනගැනීමට ලැබී ඇති හෝ බලපා ඇති යම් හානියක් අසනීපයක් කායික ආබාධයක් හෝ දුබලතාවයක් හෝ පිළිබඳව සමාගම වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

## 5. හිමිකම් පෑමේ ක්‍රියාපටිපාටිය

මෙහි පහත නිශ්චිත වශයෙන් හිමිකම පෑමේ ක්‍රියාපටිපාටියට අනුකූලව කටයුතු කර ඇත්නම් මිස මෙම රක්ෂණ ඔප්පුව යටතේ හිමි කිසිදු මුදලක් ගෙවිය නොහැකි වන්නේය.

i) රක්ෂිතයා විසින් මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමකට තුඩුදිය හැකි යම් සිදුවීමක් සිදුවූ විටද යම් හිමිකම් පෑමක් පිළිබඳව රක්ෂිතයාට දැනුම් දී ඇති අවස්ථාවකදී ද රක්ෂිතයාට විරුද්ධව ආයතනයක යම් නඩු පැවරීමක් කර ඇති විටද ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර හැකි වහාම සමාගම වෙත දැනුම් දිය යුතුය.

ii) හදිසි අනතුරක් සිදු වූ විටදී මෙම රක්ෂණ ඔප්පුවේ අර්ථානුකූලව හදිසි අනතුර සිදුවීමෙන් පසු දින 7ක් ඇතුළත ඒ පිළිබඳව දැනුම් දීමක් කර නොමැති විට ප්‍රමාදය සම්බන්ධයෙන් සාධාරණ සහ යුක්තිසහගත ලෙස නිදහසට කරුණු දැන්වීමක් කළ යුතුය.

iii) සමාගමට අවශ්‍ය සියලුම සහතික, තොරතුරු සහ සාක්ෂි රක්ෂිතයාගේ හෝ මෙහි පහත සඳහන් කවර හෝ හිමිකම පාන්නකුගේ වියදමින් සැපයිය යුතු අතර සමාගම විසින් නියම කරනු ලබන ආකාරයෙන් සහ ස්වභාවයෙන් ඒවා සැපයිය යුතුය.

iV) සමාගමේ වෛද්‍ය නිලධාරියාට හෝ වෙනත් නියෝජිතයකුට අවශ්‍ය විය හැකි ආකාරයට හැකි සෑම අවස්ථාවකදීම රක්ෂිත තැනැත්තා/තැනැත්තන් හමුවී පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

V) රක්ෂිත තැනැත්තා/තැනැත්තන් මියගිය විට සමාගමේ වියදමින් පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා සමාගමට හිමිකම් ඇත්තේය.

Vi) සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයකු භාරයේ රක්ෂිත තැනැත්තා/තැනැත්තන් ප්‍රතිකාර ලබා ඇත්නම් මිස කිසිදු වන්දියක් ගෙවිය නොහැකි වන්නේය.

Vii) රක්ෂිතයා විසින් රෝහල්ගතවීම සම්බන්ධයෙන් අදාළ සාක්ෂි සැපයිය යුතු අතර මෙම රක්ෂණ ඔප්පුව යටතේ කවර හෝ හිමිකම් පෑමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සමාගම විසින් නියම කරනු ලබන සියලුම විස්තර සැපයීම යුතු වන්නේය. මේ සම්බන්ධයෙන් කරනු ලබන කවර හෝ වියදම් ජීවිත රක්ෂිතයා විසින් දැරිය යුතුය.

## 6. නොපැවරීම

මෙම රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකි අතර මෙම රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් කරනු ලබන පැවරීමක් හෝ භාරකරු පිළිබඳ යම් වෙනස්වීමක් මෙම සමාගම විසින් පිළිගනු ලැබීම හෝ සමාගමට එයින් බලපෑමක් ඇතිවීම හෝ සිදු නොවන්නේය. මෙම රක්ෂණ ඔප්පුව යටතේ වන්දියක් හෝ යම් ප්‍රාග්ධන මුදලක් සම්බන්ධයෙන් සමාගමට ලැබිය යුතු යම් මුදලක් ලබාදීමට හෝ සමාගම එම මුදල ගෙවීමෙන් නිදහස් කිරීමට හෝ රක්ෂිතයාට හෝ ඔහු/ඇයගේ නීත්‍යානුකූල පෞද්ගලික නියෝජිතයාට කළහැකි වන අතර සමාගමට එකී අයවිය යුතු මුදල ලබාදුන් විට හෝ සමාගම එකී මුදල ගෙවීමෙන් නිදහස් කළවිට එම අයවිය යුතු මුදල සමාගමට ලබාදෙන ලද හෝ සමාගම එකී මුදල ගෙවීමෙන් නිදහස් කළ දිනයට පසු හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් හෝ සිදු වූ හදිසි අනතුරක් හේතුවෙන් රක්ෂිතයාට මුහුණ පෑම සිදු වූ අවිනිශ්චිත සිද්ධියක් (මරණය ඇතුලුව) හෝ යම් අනතුරක් සහ සෑම අනතුරක් සම්බන්ධයෙන් සමාගම සියලුම බැඳීම් වලින් සම්පූර්ණයෙන් සහ අවසාන වශයෙන් නිදහස් වූවාසේ සලකනු ලැබේ.

## 7. අවලංගු කිරීම

සමාගම විසින්, අහෝසි නොවූ රක්ෂණ කාලසීමාවට අනුරූපවන වාරිකයේ ප්‍රමාණුකූල කොටසක් ඉල්ලූවිට ආපසු ගෙවන බව සඳහන් කරමින් මෙම රක්ෂණ ඔප්පුව අවසන් කිරීමට අදහස් කරන බව අවසාන වරට දැනගත් රක්ෂිතයාගේ ලිපිනය වෙත දින හතකට (7) කලින් ලියාපදිංචි කළ තැපැලෙන් ලිපියක් මගින් දන්වා යැවිය හැකි වේ. රක්ෂිතයා විසින් සමාගම වෙත මෙවැනි දැනුම්දීමක් කිරීමෙන් ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණ ඔප්පුව අවලංගු කළ හැකිවන අතර එවැනි අවස්ථාවක දී සමාගම විසින් රක්ෂණ ඔප්පුව බලපැවැත්වූ කාලසීමාව වෙනුවෙන් පිළිගත් කෙටිකාලීන වාරික මුදලක් රඳවාගනු ලබනනේය.

## 8. නීති කෘත්‍යය

මෙම රක්‍ෂණ ඔප්පුවේ නියමයන්ට අනුකූලව මෙය නැති වූ බවට ලිඛිත සාක්‍ෂි සැපයීමෙන් අනතුරුව දින හැටක් (60) ඉකුත් වී යාමට පෙරාතුව මෙම රක්‍ෂණ ඔප්පුව සම්බන්ධයෙන් මුදල් ආපසු අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව හෝ සාධාරණ වශයෙන් හෝ කටයුතු නොකරනු ලැබේ. නැතිවීම පිළිබඳව ලිඛිත සාක්‍ෂි ඉදිරිපත් කළ යුතු කාලසීමාවෙන් පසු වසරක කාලයක් ඉකුත්වියාමෙන් අනතුරුව එවැනි නඩු පැවරීමක් නොකරනු ලැබේ.

## 9. නිරාකරණය කිරීම

මෙම රක්‍ෂණ ඔප්පුව සම්බන්ධයෙන් ඇතිවන සියලුම මතභේද එකී මතභේද හටගෙන ඇති අදාළ පාර්ශවයන් විසින් ලිඛිතව පත්කරනු ලබන බේරුම්කරුවකුගේ තීරණය සඳහා යොමු කළ යුතුය. නොඑසේ නම් එකී බේරුම්කරුවකු සම්බන්ධයෙන් එකී පාර්ශවයන් විසින් එකඟත්වයකට පැමිණිය නොහැකි නම් බේරුම්කරුවන් වශයෙන් අපක්‍ෂපාති පුද්ගලයන් දෙදෙනෙකුගේ තීරණය සඳහා එකී මතභේද යොමු කළ යුතු බව අනෙකුත් පාර්ශවය විසින් ලිඛිතව දැනුම් දීමෙන් එක් ලිත් මාසයක් ඇතුළත දෙපාර්ශවයම එක් අයකු බැගින් පත් කළ යුතුය. එසේ බේරුම්කරුවකු පත් කිරීම කවර හෝ පාර්ශවයක් විසින් ප්‍රතික්ෂේප කර හෝ එසේ කිරීමට අපොහොසත්ව ඇතිවිට තනි බේරුම්කරුවකු පත්කර ගැනීම සඳහා අනෙක් පාර්ශවයට නිදහස ඇති අතර බේරුම්කරුවන් අතර එකඟත්වයක් නොමැති නම් එය තීරකයකුගේ තීරණය සඳහා යොමුකළ යුතු අතර එය යොමු කිරීමට පෙර එකී පාර්ශවයන් විසින් ලිඛිතව තීරකයකු පත් කර තිබිය යුතු හෙයින් තීරකයා බේරුම්කරුවන්ගේ රැස්වීම්වලදී ඔවුන් සමඟ අසුන් ගෙන මුලසුන හෙබවිය යුතුය. යම් පාර්ශවයක අයකු මිය ගිය විට බේරුම්කරුවන් හෝ තීරක සතු බලතල හෝ බලය ඒ හේතුවෙන් අහෝසි නොවන අතර ඒවාට එයින් බලපෑමක්ද ඇති නොවන්නේය. බේරුම්කරුවකු හෝ තීරකයකු මිය ගිය අවස්ථාවක මියගිය අය වෙන්වෙන්. එක් එක් අවස්ථාවේදී වෙනත් තැනැත්තකු පත්කළ යුත්තේ එසේ මියගිය බේරුම්කරු හෝ තීරක පත්කරනු ලැබූ අදාල පාර්ශවය හෝ බේරුම්කරුවන් (අවස්ථාචෝචිතව) විසින්ය. තීරණය සඳහා යොමු කිරීම සහ තීරණය සම්බන්ධයෙන් වියදම් දැරිය යුත්තේ තීරණය දෙනු ලබන බේරුම්කරු, බේරුම්කරුවන් හෝ තීරකයාගේ අභිමතය පරිදි වන අතර මෙම රක්‍ෂණ ඔප්පුව සම්බන්ධයෙන් නීති මගින් ක්‍රියා කිරීම හෝ නඩු පැවරීමේ යම් හිමිකමකට පෙරාතුව එකී බේරුම්කරුවකු, බේරුම්කරුවන් හෝ තීරකගේ තීරණය පළමුවෙන් ලබාගත යුතුය යන කොන්දේසිය ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් පැහැදිලිව නියම කර ප්‍රකාශයට පත්කරනු ලැබේ. මෙම රක්‍ෂණ ඔප්පුව යටතේ යම් හිමිකම් පෑමක් වෙනුවෙන් රක්‍ෂිතයා සම්බන්ධයෙන් ඇති වගකීම සමාගම විසින් නොපිළිගනු ලැබුවහොත් එය පිළිගනු ලැබූ දින සිට ලිත් මාස දොළහක් ඇතුළත එකී හිමිකම් පෑම මෙහි අන්තර්ගත විධිවිධාන යටතේ නිරාකරණය කිරීම සඳහා යොමුකර නොමැත්තේ නම් හිමිකම් පෑම සියලු කාර්යයන් සඳහා අතහැර ඇති බවට සැලකෙන අතර මේ යටතේ ඉන් අනතුරුව ආපසු අයකරගත නොහැකි වන්නේය.

## 10. නියමයන් සහ කොන්දේසි පිළිපැදීම

රක්‍ෂිතයා විසින් පිළිපැදිය යුතු හෝ කළ යුතු ඕනෑම දෙයක් සම්බන්ධයෙන් මෙම රක්‍ෂණ ඔප්පුවේ නියමයන්, කොන්දේසි සහ සටහන් අදාළව පවතින තාක් කල් එකී නියමයන්, කොන්දේසි සහ සටහන් ක්‍රියාත්මක කර නිසිලෙස පිළිපැදිය යුතු අතර, මෙම රක්‍ෂණ ඔප්පුව යටතේ යම් ගෙවීමක් සිදු කිරීම සඳහා සමාගම කවර හෝ ලෙස බැඳීමට පෙරාතුව ප්‍රකාශ වල සත්‍යතාව සහ එකී යෝජනාවේ පිළිතුරු කොන්දේසි වශයෙන් ක්‍රියාත්මක කළ යුත්තේය.

සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
4 වෙනි මහල, සෙලින්කෝ මන්දිරය, අංක:-69, ජනාධිපති මාවත, කොළඹ 01
දු:ක: 2485745, 2485757-9, 4-702702 ෆැක්ස් :-2485720